

# විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ශ්‍රම සංක්‍රමණයෙහි කාර්තුමය විවරණිකාව

4 වන කාර්තුව - 2022


විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ප්‍රධාන කරුණු ....

- 2022 වසර තුළ වැඩිම මාසික විදේශ විනිමය ප්‍රේෂණ අගයක් වාර්තා කරමින්, විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයකන්ගේ ප්‍රේෂණ 2021 දෙසැම්බර් මාසයේදී පැවති එ.ජ.ඩොලර් මිලියන 325.2 සිට 2022 දෙසැම්බර් මාසයේදී එ. ජ. ඩොලර් මිලියන 475.6 දක්වා වර්ධනය විය.
- 2022 වසර තුළදී ලැබුණු සමස්ත විදේශ විනිමය ප්‍රේෂණ වල වටිනාකම එ. ජ. ඩොලර් මිලියන 3,789.4 ක් විය.
- 2022 වසරේ 4 වන කාර්තුවේ දී වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇත්තේ කුවේට්, කටාර් සහ සවුදි අරාබිය යන රටවල් වලිනි.
- 2022 වසරේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර එහි මාසික සාමාන්‍ය සංක්‍රමණිකයින්ගේ ප්‍රමාණය 25,939ක් ලෙස වාර්තා විය.


## විදේශ විනිමය ප්‍රේෂණ ගලා ඒමේ වර්ධනයන්

*රූප සටහන 1:* විදේශ විනිමය ප්‍රේෂණ වල මාසික වෙනස්වීම




*මූලාශ්‍රය: බලපත්‍රලාභී බැංකු*


*රූප සටහන 2:* වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%)




*මූලාශ්‍රය: බලපත්‍රලාභී බැංකු*


2022 තුන්වන කාර්තුවේදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 321 ක මාසික සාමාන්‍ය ප්‍රේෂණ වලට සාපේක්ෂව 2022 සිව්වන කාර්තුව තුළදී විදේශ විනිමය ප්‍රේෂණ ගලා ඒම එ.ජ.ඩොලර් මිලියන 405 ක මාසික සාමාන්‍යයක් වාර්තා කරමින් මෑත මාසවලදී වැඩිදියුණුවීමක් පෙන්නුම් කර ඇත.

*රූප සටහන 3:* ගමනාන්ත රට අනුව විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ගලා ඒම - 4 වන කාර්තුව - 2022 (අ)




*මූලාශ්‍රය: බලපත්‍රලාභී බැංකු*

*රූප සටහන 4:* රට අනුව ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ගලා ඒමේ ව්‍යාප්තිය - 4 වන කාර්තුව 2022





*මූලාශ්‍රය: බලපත්‍රලාභී බැංකු*


කුවේට්, කටාර්, සවුදි අරාබිය සහ එ.අ. එමීර් රාජ්‍යය යන රටවලින් වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇත.

(අ) වෙනත් කාණ්ඩයට අයත් රටවලින් ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 206.9 ක විදේශ ප්‍රේෂණ සහ සමහර ගෝලීය ප්‍රේෂණ මාර්ග, යෙදුම් සහ වෙනත් මාර්ග හරහා ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 182.8 ක විදේශ ප්‍රේෂණ රට අනුව බෙදා වෙන්කිරීමේදී මෙහි ඇතුළත් නොවේ.

රූප සටහන 5: සමුච්චිත විදේශ විනිමය ප්‍රේෂණ ගලා ඒම
ජනවාරි - දෙසැම්බර් (2019 - 2022)





රූප සටහන 6: විදේශ විනිමය ප්‍රේෂණ වල මාසික සාමාන්‍යය අගය
ජනවාරි - දෙසැම්බර් (2019 - 2022)




**2021 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 5,491.0 ක ප්‍රමාණයට සාපේක්ෂව 2022 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 315.8 ක මාසික සාමාන්‍යයක් වාර්තා කරමින් මෙම වසර තුළදී සමස්ත විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රමාණය එ. ජ. ඩොලර් මිලියන 3,789.4 ක් දක්වා ලඟාවිය.**

## විදේශ රැකියා සඳහා පිටත්වීම්වල සහ විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණවල කාර්ය සාධනය


රූප සටහන 7: විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශ රැකියා සඳහා පිටත්වීම්





**විදේශ රැකියා සඳහා පිටවීම්වල වැඩිවීමට අනුරූපව විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ගලා ඒමේ ප්‍රගතියක් මෑත මාසවල දක්නට ලැබුණි.**

## විගමණික ශ්‍රමිකයින්ගේ වර්ධනයන්

රූප සටහන 8: විදේශ රැකියා සඳහා පිටත්වීම්වල මාසික වෙනස්වීම





රූප සටහන 9: විදේශ සේවා සඳහා පිටත්වීම් වල වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස් වීම (පුද්ගලයින් ගණන)





**2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී විදේශ රැකියා සඳහා පිටත්වගිය ප්‍රමාණයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි.**

*රූප සටහන 10:* **විදේශ රැකියා සඳහා පිටත්වීම් වල උපනතිය**
**ජනවාරි - දෙසැම්බර් (2019 - 2022)**




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

*රූප සටහන 11:* **විදේශ රැකියා සඳහා පිටත්වීම්වල මාසික සාමාන්‍යය**
**ජනවාරි - දෙසැම්බර් (2019 - 2022)**





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**2022 ජනවාරි-දෙසැම්බර් කාලය තුළ, විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 311,269 ක් වූ අතර එහි මාසික සාමාන්‍යය පුද්ගලයන් 25,935 ක් විය.**


## රැකියා මට්ටම් අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම - 2022

*රූප සටහන 12:* **ස්ත්‍රී පුරුෂ භාවය සහ රැකියා වර්ගය අනුව පිටත්වීම් සංඛ්‍යාව (Q1 - Q4)**




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

*රූප සටහන 13:* **රැකියා මට්ටම අනුව මුළු සේවා නියුක්තියේ සංයුතිය (ජන-දෙසැ)**





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**විදේශ රැකියා සඳහා කාන්තා සහභාගිත්වය අර්ධ නිපුණතා කාණ්ඩය කෙරෙහි වැඩි වශයෙන් සංකේන්ද්‍රණය වී ඇති අතර පිරිමි සහභාගිත්වය නිපුණතා කාණ්ඩය කෙරෙහි සංකේන්ද්‍රණය වී ඇත.**

**විදේශ රැකියා සඳහා සම්පූර්ණ සහභාගීත්වයෙන් (පිරිමි සහ ගැහැණු) 60% කට ආසන්න ප්‍රමාණයක් සංකේන්ද්‍රණය වී ඇත්තේ අර්ධ පුහුණු සහ නුපුහුණු කාණ්ඩවල ය.**


## ගමනාන්ත රට සහ කලාපය අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම් - 2022

*රූප සටහන 14:* **ගමනාන්ත රට අනුව පිටත්වීම් (ජනවාරි-දෙසැම්බර්)**




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

*රූප සටහන 15:* **ගමනාන්ත කලාපය අනුව පිටත්වීම් (ජනවාරි-දෙසැම්බර්)**





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**2022 වසර තුළදී පිරිමි සහ කාන්තා සංක්‍රමණික සේවකයින්ගේ ප්‍රධාන ගමනාන්ත වන්නේ පිළිවෙලින් කුවේට් සහ කටාර් ය.**

**සංක්‍රමණික සේවකයින්ගෙන් බහුතරයක් (85%) මැදපෙරදිග රටවල සේවය කරති.**

## ගමනාන්ත රට අනුව විගමණික ශ්‍රමිකයින්ගේ කාර්තුමය ප්‍රවණතාවය - 2022


*රූප සටහන 16:* ගමනාන්ත රට අනුව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පිටත්වීම් - 2022 ජන - දෙසැ




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


## වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම් - ( 2022 ජන - දෙසැ)

*රූප සටහන 17:* වයස අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම්




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

*රූප සටහන 18:* ස්ත්‍රී පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා මුළු පිටත්වීම්





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**පිරිමි විගමණික ශ්‍රමිකයන්ගෙන් වැඩිම ප්‍රමාණයක් (20%) වයස අවුරුදු 25 - 29 කාණ්ඩයේ වන අතර, වැඩිම කාන්තා විගමණික ශ්‍රමිකයින් ප්‍රමාණයක් (20%) වයස අවුරුදු 40 - 44 කාණ්ඩයේ වේ.**


## මුළු පිටත්වීම් (විදේශගත වීම්) සහ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම්

*රූප සටහන 19:* ශ්‍රී ලාංකිකයන්ගේ මුළු පිටත්වීම් (විදේශගත වීම්) - මාසික




*මූලාශ්‍රය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව*

*රූප සටහන 20:* විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම් - මාසික





*මූලාශ්‍රය: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව*

**2022 වසර පුරාවට මාසිකව මුළු පිටත්වීම් ඉහළ අගයක පැවතිණි.**

**විදේශ රැකියා සඳහා පිටත්වීම් ඉහළ යාමත් සමඟ 2022 දී විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම් ද වැඩි විය.**

## විදේශ රැකියා සඳහා පිටත්වීම් සහ ශ්‍රී ලංකාවෙන් සිදු වූ සමස්ත පිටත්වීම් අතර සම්බන්ධතාව

***රූප සටහන 21:*** **විගමණික ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය මුළු පිටත්වීම් වල ප්‍රතිශතයක් ලෙස**






**2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී ශ්‍රී ලාංකිකයන්ගේ මුළු පිටත්වීමේ ප්‍රතිශතයක් ලෙස විගමණික ශ්‍රමිකයින්ගේ ප්‍රමාණය සාපේක්ෂව අඩු අගයක් ගනී.**

සටහන: මුළු පිටත්වීම්වලට ශ්‍රී ලංකාවෙන් සිදු වූ සියළු පිටත්වීම් ඇතුළත් වේ.

## විගමණික ශ්‍රමිකයින්ගේ ඝනත්වය

***රූප සටහන 22:*** **දිස්ත්‍රික්කය අනුව ජනගහනය 100,000කට විදේශ රැකියා සඳහා පිටත්වීම්**





**2021 සහ 2022 වසර වලදී සෑම දිස්ත්‍රික්කයකම ජනගහනයට සාපේක්ෂව වැඩිම විගමණික ශ්‍රමිකයින්ගේ ප්‍රමාණය මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.**

## ගෝලීය සංසන්දනය

***රූප සටහන 23:*** **2020 සහ 2021 වසර වලදී තෝරාගත් දකුණු ආසියානු රටවල විදේශ විනිමය ප්‍රේෂණ ගලා ඒම**




*මූලාශ්‍රය: KNOMAD/ලෝක බැංකුව, 2022.*

## විදේශීය විනිමය ප්‍රේෂණ සහ විදේශ රැකියා සඳහා පිටත්වීම් දිරිමත් කිරීම සඳහා මෑත කාලීනව ගනු ලැබූ පියවර

- **2022 පෙබරවාරි 01 දින සිට විදේශ සේවා නියුක්තිකයින් විසින් මෙරටට මුදල් ප්‍රේෂණය කිරීමේදී දරනු ලබන ගනුදෙනු පිරිවැය රුපියල් 1,000ක් දක්වා ප්‍රතිපූරණය කිරීමේ දිරිගැන්වීමක් හඳුන්වා දීම.**
- **2022 අගෝස්තු 08 වැනි දින ශ්‍රී ලංකාවට එවන ලද විදේශ ප්‍රේෂණ ප්‍රමාණය අනුව විදෙස්ගත් සේවා නියුක්තිකයින් සඳහා අතිරේක තීරුබදු රහිත දීමනාවක් ලබා දීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.**
- **2022 අගෝස්තු 31 දින විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් සඳහා පූර්ණ විද්‍යුත් වාහනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීම පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.**
- **2022 සැප්තැම්බර් 26 වන දින ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව, විදේශගත ශ්‍රමිකයින් සඳහා "මනුසවි" නම් විශේෂ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.**
- **2022 ජුනි 27 වැනි දින වයස අවුරුදු දෙකේ (02) හෝ ඊට වැඩි දරුවන් සිටින කාන්තාවන් රැකියා සඳහා විදේශගත වන විට පවුල් පසුබිම් වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලදී.**
- **2022 සැප්තැම්බර් 01 වන දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ට ගුවන් තොටුපළේදී වැඩි පහසුකම් සැලසීමේ අරමුණින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීමේ පර්යන්තයේ "HOPE GATE" නමින් විශේෂ පිවිසුමක් ස්ථාපිත කරන ලදී.**

***සටහන: 2022 වර්ෂය සඳහා වන දත්ත තාවකාලික වේ.***